
# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## வருடாந்த செயலாற்றுகை அறிக்கை

## Annual Performance Report

# 2020



**මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ**
**රාජ්‍ය අමාත්‍යාංශය**

நிதி மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு
இராஜாங்க அமைச்சு

**State Ministry of Money & Capital Market and**
**State Enterprise Reforms**

## 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය
## වැය ශීර්ෂ අංකය : 413

අන්තර්ගතය

පිටු අංකය


**පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම 02
1.2 රාජ්‍ය අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, අරමුණු 03
1.3 විශේෂ ප්‍රමුඛතා 04
1.4 සංවිධාන සටහන 06
1.5 රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ 07
1.6 රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 07

**පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

2.1 2020 වර්ෂයේ දී ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් 08
2.2 මුහුණ දුන් ප්‍රධාන ගැටළු 08
2.3 අනාගත ඉලක්ක 08

**පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 10
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 11
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 12
3.4 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 13
3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 13

**පරිච්ඡේදය 04 - මානව සම්පත් පැතිකඩ**

4.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 14

**පරිච්ඡේදය 05 - අනුකූලතා වාර්තාව**

## පරිච්ඡේදය 01
## ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය 2020.09.25 දින සංශෝධිත පරිදි 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2187/27 යටතේ අලුතින් පිහිටුවන ලද රාජ්‍ය අමාත්‍යාංශයකි. ශ්‍රී ලංකාව තුල ප්‍රීතිමත් පවුල් පරිසරයකට සහ නීතිගරුක සමාජයකට මඟ පෙන්වමින් රටේ පුරවැසියන්ට සමෘද්ධිමත් හා සෑහීමකට පත් විය හැකි ආකාරයේ පරිසරයක් සැකසීම වෙනුවෙන් "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්" නිර්මාණය කිරීම සඳහා, ගරු මුදල් අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම යටතේ මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යාවසාය ප්‍රතිසංස්කරණ යන විෂයයන්ට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට සහාය වීම රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය වේ.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ඇතුළු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව එහි කාර්යභාරය ඉටු කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ඇත. අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද ඉහත සඳහන් ගැසට් නිවේදනයට අනුව මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරය විශේෂ ප්‍රමුඛතා දහයක් යටතේ අර්ථ දක්වා ඇත.

ඒ අනුව රාජ්‍ය අමාත්‍යාංශයේ නෛතික රාමුව පහත සඳහන් නීති මගින් ආවරණය කෙරේ.

- 1975 අංක 13 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත
- 2006 අංක 30 දරණ ගෙවීම් උපක්‍රම වංචා පනත
- 1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත
- 2019 අංක 12 දරණ ඌණ ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ (ඉවත් කිරීමේ) පනත .

අළුතින් පිහිටුවන ලද ආයතනයක් වන බැවින් රාජ්‍ය අමාත්‍යාංශයේ නිසි හා විධිමත් ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සේවක සංඛ්‍යාව නිර්මාණය කිරීම, බඳවා ගැනීම, මිලදී ගැනීම, පරිශ්‍ර සකස් කිරීම වැනි මූලික කටයුතු සිදු කළ යුතුව තිබුණි.

රාජ්‍ය අමාත්‍යාංශය අලුතින් පිහිටුවන ලද නමුත් 2020 වර්ෂයේ අවසාන මාස හතර තුළ මූලික කටයුතු කිහිපයක් සිදු කළ හැකි විය. ආර්ථිකයේ ස්ථාවරත්වය සහතික කිරීම පිණිස පද්ධති සහ පාලනයන් විධිමත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා

අඛණ්ඩ මග පෙන්වීමක් ලබා දෙමින් රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කර ඇත . රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රවර්ධනය කිරීමේ ජාත්‍යන්තර ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම හරහා විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ අනුග්‍රහය යටතේ ගෝලීය හා දේශීය මට්ටමේ විවිධ ආයෝජකයින් සමඟ මෙන්ම අමාත්‍යවරුන්, විවිධ රටවල තානාපතිවරුන් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සහ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) වැනි රජයේ ආයතන සමඟ සාකච්ඡා ගණනාවක් පැවැත්විණි. මීට අමතරව, සරල කරන ලද ක්‍රියාවලීන් හා රෙගුලාසි හරහා දේශීය හා විදේශීය ආයෝජකයින්ට පහසුකම් සැලසීම මඟින් ඔවුන්ගේ උනන්දුව වැඩි කිරීම සඳහා ලෝක බැංකුව විසින් හඳුන්වා දෙන ලද Ease of Doing Business දර්ශකය ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ගන්නා ලදී. තවද, වැඩිදියුණු කළ වෙළඳපොළ පහසුකම් සැපයීම මෙන්ම ඉල්ලුම් ක්‍රියාමාර්ග සහ සැපයුම් ක්‍රියාමාර්ග තුළින් ප්‍රාග්ධන වෙළඳපොළේ ධාරිතාව සහ ප්‍රමාණය වැඩි කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ලද ණය මුදලක් වන ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන සම්බන්ධ ලිපි හුවමාරුව පවත්වා ගෙන යාම සඳහා පියවර ගන්නා ලදී. එසේම, දේශීය ආයෝජකයින් විශාල ප්‍රමාණයක් විශේෂයෙන් රටේ ග්‍රාමීය ප්‍රජාව ග්‍රහණය කර ගැනීම සඳහා කොටස් වෙළඳපොල පිළිබඳ තොරතුරු සිංහල භාෂාවෙන් මෙන් ම සරල ආකාරයකින් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලෙස කොළඹ කොටස් හුවමාරුවට උපදෙස් දී තිබේ.

2021 සහ ඉන් ඔබ්බට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත පරිදි වේ.

1. ඉදිරි සිව් වසර තුළ කොටස් වෙළඳපොලේ දැනට ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරී සමාගම් සංඛ්‍යාව 280 සිට 500 දක්වා වැඩි කිරීමට අවශ්‍ය යෙදවුම් / නියෝග ලබා දීම.
2. මූල්‍ය අංශයේ ස්ථායිතාව තහවුරු කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කෙටිකාලීන හා දිගු කාලීන ඒකාබද්ධ වැඩසටහන් සම්පාදනය කිරීමට සහාය වීම.
3. Ease of Doing Business දර්ශක වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
4. "One-Stop-Shop" සංකල්පය අනුගමනය කිරීම හා ආයෝජන මණ්ඩලයේ සහයෝගයෙන් වැඩසටහන අධීක්ෂණය කිරීම.
5. ශ්‍රී ලංකාව වෙත සෘජු විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ජාත්‍යන්තරව ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම.
6. රජය සතු ව්‍යාපාරයන් (SOEs) වාණිජමය වශයෙන් ශක්‍ය සහ මූල්‍යමය වශයෙන් ස්වාධීන බවට පරිවර්තනය කිරීම සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

ලෝකයේ වඩාත් ම ආකර්ෂණීය මූල්‍ය ගමනාන්තය ශ්‍රී ලංකාවයි.

**මෙහෙවර**

- දේශීය ව්‍යවසායකයින් සවිබල ගැන්වීම
- හිතකර වූ ආයෝජන වේදිකාවක් නිර්මාණය කිරීම

➢ මූල්‍ය ආයතන සහ රාජ්‍ය ව්‍යවසායන් ශක්තිමත් කිරීම

➢ ප්‍රතිසංස්කරණ සිදු කිරීම සහ ප්‍රතිපත්ති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

➢ ජාත්‍යන්තර ව්‍යාපාර සහ මහා පරිමාණ ආයෝජකයින් ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැපයීම; සහ මහජනතාව දැනුවත් කිරීම

යනාදිය මඟින් ආයෝජන, ඉතිරිකිරීම් සහ මූල්‍ය ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පරිසරය අපි ශක්තිමත් කරමු.

අරමුණු

➢ ප්‍රාග්ධන වෙළඳපොළ වැඩිදියුණු කිරීම සඳහා ව්‍යවසාය ප්‍රතිසංස්කරණ හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වීම.

➢ ආයෝජන සඳහා උචිත පරිසරයක් උදෙසා පහසුකම් සැපයීම.

➢ රජය සතු ව්‍යාපාරවල (SOE) කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

➢ ව්‍යාපාරික ක්ෂේත්‍රයට නිසි අයුරින් හා තරඟකාරී ලෙස ප්‍රවේශය ලබා ගැනීමට දේශීය ව්‍යවසායකයින් බල ගැන්වීම.

## 1.3 රාජ්‍ය අමාත්‍යාංශයේ විශේෂ ප්‍රමුඛතා

2018.08.09 දිනැති 2187/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව, මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් පවරා ඇත.

1. ඉතුරුම් සහ ආයෝජන දිරිගැන්වෙන ආකාරයෙන් බැංකු, මූල්‍ය ආයතන ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම.

2. අසාර්ථක මූල්‍ය ආයතන සහ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම.

3. කෘෂිකාර්මික, ඉදිකිරීම්, තොරතුරු තාක්ෂණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, සංචාරක හා අපනයන අංශ සංවර්ධනය කිරීම සඳහා ජාතික සංවර්ධන, මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපොළ වැඩසටහන් පුළුල් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

4. රජයේ බැඳුම්කර සහ කොටස් වෙළඳපොළ ආකර්ශනීය කිරීම.

5. භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල සහ ප්‍රාථමික වෙළඳපොළවල නියාමන හා ප්‍රතිසංස්කරණ කටයුතු ශක්තිමත් කිරීම.

6. ජාත්‍යන්තර ව්‍යාපාරික බලවතුන්ට ඔවුන්ගේ ප්‍රධාන කාර්යාල කොළඹ සහ වරාය නගරය තුළ පිහිටුවීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

7. විදේශීය ආයෝජකයින් රට තුළට ආකර්ෂණය කර ගැනීම සඳහා පෞද්ගලික අංශයේ සහය ඇතිව "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම.


8. උසස් තාක්‍ෂණික නිෂ්පාදන නිපදවීම ආරම්භ කිරීම උදෙසා මහා පරිමාණ දේශීය ආයෝජකයින් සඳහා පහසුකම් පුළුල් කිරීම.

9. දේශීය ව්‍යවසායකයින් සඳහා නිසි පරිදි හා තරඟකාරීව ව්‍යාපාරික ක්ෂේත්‍ර වෙත ප්‍රවේශය ලබා ගැනීම, ව්‍යවසායකයින් ආරක්ෂා කිරීම සහ සවිබල ගැන්වීම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

10. ආර්ථික හා සමාජීය වශයෙන් ජාතික ආර්ථිකයට රාජ්‍ය ව්‍යවසායන් දක්වන දායකත්වය ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ මූල්‍ය ධාරිතාව ඉහළ නැංවීම සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

1.4

## සංවිධාන ව්‍යුහය
## මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය



**1.5.** රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ

I. පාලන අංශය

II. මූල්‍ය අංශය

III. සංවර්ධන අංශය

a. ප්‍රාග්ධන වෙළඳපොළ ඒකකය

b. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ඒකකය

c. සැලසුම් ඒකකය

**1.6** රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

I. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

II. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

III. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

IV. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

## පරිච්ඡේදය 02
## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 2020 වර්ෂය තුළ ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

- ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළඳපොළ මඟින් කාර්ය සාධනය වැඩි දියුණු කිරීම;
- ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තු විෂය පථයට අයත් ව්‍යාපෘති මගින් ලබා දෙන ප්‍රතිඵල වැඩි දියුණු කිරීම;
- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනෙන රජය සතු ව්‍යාපාරවල කාර්ය සාධනය වැඩිදියුණු කිරීම;
- ශ්‍රී ලාංකික ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ සාමාන්‍ය ජනතාව අතර දැනුම වැඩි කිරීම ;
- ඌණ උපයෝජිත වත්කම් පනත යටතේ නිශ්චිතව දක්වා ඇති ඌණ උපයෝජිත රාජ්‍ය වත්කම් අඩු කිරීම ;
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය වැඩි කිරීම;

### 2.2 මුහුණ දුන් ප්‍රධාන ගැටළු

- ජාතික මට්ටමින් අධීක්ෂණ වගකීමක් සහිත රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා වෘත්තීයමය වශයෙන් උපායමාර්ගික මට්ටමේ නිලධාරීන් නොමැති වීම.
- හඳුන්වා දී ඇති ආයතනික ප්‍රතිසංස්කරණ යථාර්ථවාදී මට්ටමකට ගෙන ඒමට දැඩි උත්සාහයක් දැරීම.
- රාජ්‍ය ව්‍යාපාරයන්හි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට වැඩි කාලයක් ගත වීම.

### 2.3 අනාගත ඉලක්ක

- දැනට කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරී සමාගම් සංඛ්‍යාව 280 සිට 500 දක්වා වැඩි කිරීම.
- Ease of Doing Business දර්ශකයේ වත්මන් ශ්‍රේණිගත කිරීම 90 සිට 99 දක්වා වැඩි දියුණු කිරීම.
- සෘජු විදේශ ආයෝජන ගෙන ඒම සඳහා ආයෝජන ආකර්ශනීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## පරිච්ඡේදය 03
## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

**වාර්තා කිරීමේ පදනම**

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

4) දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම සහ මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීතය

මෙම සංචිත ගිණුම දේපළ , පිරියත සහ උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යාවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 339,401 | - |
| අග්‍රිම ලැබීම් | 18,870,000 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 19,209,401 | - |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 17,534,996 | - |
| සහනාධාර සහ මාරුකිරීම් | 77,958 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 461 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 17,613,415 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | 1,595,986 | - |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 213,385 | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | 213,385 | - |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 1,392,710 | - |
| අත්තිකාරම් ගෙවීම් | 416,661 | - |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 1,809,371 | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | (1,595,986) | - |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | - | - |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 117,047 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | 117,047 | - |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 117,047 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | 117,047 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

# 2020 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 19,859,351 | - |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(අ) | 4,671,114 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | 24,530,465 | - |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 4,671,114 | - |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 19,859,351 | - |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(ආ) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | 24,530,465 | - |

පිටු අංක 1 සිට 65 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 66 සිට 73 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 24/2/21 | දිනය : 22-02-2021 | දිනය : 19.02.2021 |
| එස්. ආර්. ආටිගල<br>මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්<br>මුදල් අමාත්‍යාංශය<br>මහලේකම් කාර්යාලය<br>කොළඹ 01. | ආර්. එම්. ඒ. රත්නායක<br>ලේකම්<br>මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය | නෙලුකා එම් පටබැඳිගේ<br>ගණකාධිකාරි<br>මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය |

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2020 | | සටහන | තථ්‍ය 2020 | 2019 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 18,870,000 | - | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 117,047 | - | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම, | | 738,740 | - | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 339,401 | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 20,065,188 | - | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 20,065,188 | - | |
| | අඩුකළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 15,400,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 9,767,174 | - | ඒසීඒ-2(ii) |
| 12,460,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 7,767,823 | - | ඒසීඒ-2(ii) |
| 100,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 77,958 | - | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 27,960,000 | මුළු පුනරාවර්තන වියදම් (ඈ) | | 17,612,955 | - | |
| | මූලධන වියදම් | | | | |
| 1,050,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | - | - | ඒසීඒ-2(ii) |
| 1,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 1,392,710 | - | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| - | හැකියා වර්ධනය | 14 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| 2,550,000 | මුළු මූලධන වියදම් (ඉ) | | 1,392,710 | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 5,526,901 | - | |
| | තැන්පතු ගෙවීම් | | 117,047 | - | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 5,409,854 | - | ඒසීඒ-5 |
| 30,510,000 | මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ) | | 24,532,565 | - | |
| - | 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ) | | (4,467,377) | - | |

## 3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 3.4 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදනඅවසන් , කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 28,110,000 | 27,960,000 | 17,612,955 | 63% |
| ප්‍රාග්ධන | 2,400,000 | 2,550,000 | 1,392,710 | 55% |

සටහන :

මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු මස සිට පිහිටුවන ලදී. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මාස පහක (05) කාල සීමාව සඳහා තාවකාලික අයවැය ප්‍රතිපාදන තක්සේරු කර වෙන් කරන ලදී.

## 3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය ලෙස% වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 19,859,351 | 19,859,351 | - | 100% |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## පරිච්ඡේදය 04
## මානව සම්පත් පැතිකඩ

### 4.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය - 2020 | | | |
|---|---|---|---|
| | | | |
| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | |
| රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | 01 | 01 | - |
| අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ක්‍රා.සේ ලේකම්.) | 01 | 01 | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී.ලං.ප.සේ) | 01 | 01 | - |
| ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ) | 01 | - | 01 |
| අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) | 01 | - | 01 |
| අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍රා.සේ.) | 01 | - | 01 |
| අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ග.සේ) | 02 | - | 02 |
| සහකාර ලේකම් (ශ්‍රී.ලං.ප.සේ) | 01 | - | 01 |
| සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍රා.සේ.) | 01 | 01 | - |
| ගණකාධිකාරී | 03 | 02 | 01 |
| එකතුව | 13 | 06 | 07 |
| තෘතීයික මට්ටම | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 01 | - | 01 |
| සම්බන්ධීකරණ ලේකම් (අනියම්) | 01 | - | 01 |
| එකතුව | 02 | 00 | 02 |
| ද්විතියික මට්ටම | | | |
| සංවර්ධන නිලධාරී | 11 | 06 | 05 |
| කළමනාකරණ සේවා නිලධාරී | 08 | 07 | 01 |
| එකතුව | 19 | 13 | 06 |
| ප්‍රාථමික මට්ටම | | | |
| රියදුරු (ඒකාබද්ධ රියදුරු සේවය) | 06 | 02 | 04 |
| කාර්යාල සහකාර සේවය (කා.සේ.සේ.) | 06 | 04 | 02 |
| එකතුව | 12 | 06 | 06 |
| මුළු එකතුව | **46** | **25** | **21** |

## පරිච්ඡේදය 05
## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශගිණුම්/ දිනට ඉදිරිපත් කොට තිබේ නියමිත | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ. | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ. | | |
| **02** | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගේන යාම | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අදාල නොවේ. | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **03** | මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135) | | | |
| 3.1 | ආයතනය තුල මූල්‍ය බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 2004/171 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී එය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත් ව ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ. | | |
| **04** | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ. | 2020 අගෝස්තු මාසයේදී රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලදී. වසර අවසානයේදී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කාලය නොමැත. | 2021 දී ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට දැනටමත් පියවර ගෙන ඇත |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ. | 2020 අගෝස්තු මාසයේදී රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලද අතර අභ්‍යන්තර විගණන ඒකකය සඳහා කිසිදු කාර්ය මණ්ඩලයක් වෙන් කර නොතිබුණි. | 2021 සිට මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු භාර ගෙන ඇත |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 05 | විගණන විමසුම් | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | විගණන විමසුම් කිසිවක් ලැබී නැත | | |
| 06 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ.134 (2) DMA/1-2019 අනුව, වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත | රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ලැබී නොමැත | | 2021 සිට මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු භාර ගෙන ඇත |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අදාල නොවේ. | | |
| 6.3 | 2018 හි අංක19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම . | අදාල නොවේ. | | |
| 6.4 | මු.රෙ.134(3) අනුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අදාල නොවේ. | | |
| 07 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | කළමනාකරණ විගණන චක්‍රලේඛ 1-2019 අනුව වර්ෂය තුල අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් පවත්වා තිබීම . | අදාල නොවේ. | | |
| 08 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 2017/01 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එහි සඳහන් විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියකු පත් කර ඒ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/ 05 ට අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම | අතිරික්ත හෝ ඌණතා නොමැත | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අතිරික්ත හෝ ඌණතා නොමැත | | |
| 09 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | සංචිත වාහන වෙන් කර නොමැත | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දි අපහරණය කර තිබීම | අදාල නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | මුදල් අමාත්‍යාංශයෙන් වාහන පවරා ඇත. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ. 103, 104,109,110 ප්‍රකාර ව කටයුතු කිරීම | අදාල නොවේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 පරිච්ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාර ව වාහන වල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම. | අදාල නොවේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව වාහන වල ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අදාල නොවේ. | | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර, සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අක්‍රිය බැංකු ගිණුම් නොමැත | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතු ව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර ව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94.(1) ප්‍රකාරව උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන සීමාව නො ඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම. | අනුකූල වේ. | | |
| 12 | රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟ ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **13** | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාර ව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| **14** | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාර ව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාර ව අනුමත සීමාව ඉක්මවා නො යන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |
| **15** | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | කාල සීමාව තුළ ආදායම් නොමැත | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නො කොට ඍජුව ම ආදායමට බැර කර තිබීම | ආදායම් නොමැත | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | ආදායම් නොමැත | | |
| **16** | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළු ම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිත ව ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 16.3 | 2017.09.20 දිනැති අංක 04/2017 දරන චක්‍රලේඛය ප්‍රකාර ව සියලු ම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| **17** | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාර ව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ඒ තුලින් මහජනයාගේ ප්‍රශංසා හා චෝදනා පල කිරීමට ද පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | කොරතුරු දැන ගැනීමේ පනතේ 8 හා 10 වන වගන්ති ප්‍රකාර ව වසරකට වතාවක් හෝ වසරකට දෙවතාවක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 05/2008 හා 05/2018 (1) අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම් කටයුතු හා ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණ හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් ආයතනය විසින් ම සකස් කොට තිබීම | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018 01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාර ව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කර තිබීම | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අදාල නොවේ. | | |

අවසානය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | TRE/C/SMMCR/2020/FA/02 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021 ජූනි 24 දින |

ගණන්දීමේ නිලධාරී

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය

**මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමි යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී . මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි .

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් 2018 අංක 19 දරණ විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නිරිදේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) ප්‍රතිපාදන මාරු කිරීම (මු.රෙ.66)

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වියදම් වැය විෂයය 18 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර සියයට 99 සිට සියයට 433 දක්වා පරාසයක විචලතාවයක් නිරීක්ෂණය විය.

(ආ) නිෂ්ඵල වූ ප්‍රතිපාදන

මූලධන වැය විෂයයන් 3 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 3 ක් සඳහා වාර්ෂික අයවැයෙන් වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදනය වූ රු. 2,540,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ඇ) අධි ප්‍රතිපාදන සලසා ගැනීම

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 17 ක් සඳහා රු. 16,820,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු. 8,221,133 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ක සිට සියයට 84 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 හි 10.1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමට සැකසිය යුතු වුවද, එය මුදල් පදනමට සැකසීම මත අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 5,206,570 ක් හා රු. 5,409,853 ක් වුවද, එය මුදල් පදනමට සැකසීම නිසා ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 213,385 ක් හා රු. 436,661 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු 12 වන දින පිහිටුවා තිබූ අතර, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

එස්.එම්.ඩී.එස්. සුදිෂ් රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට